මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**
14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வதுமாடி, சுஹுருபாய, பத்தரமுல்ல, இலங்கை.
14th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. PS/03/PB/GEN/07/15/22

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசி / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දු. / தொ. / Tel : 011 2868145; ෆැක්ස් / பெ. / Fax : 011 2868135

දිනය / திகதி / Date 2022.07.22

22/1033/626/001

අමාත්‍ය මණ්ඩල සංදේශ අංක - 23/2022

අමාත්‍ය මණ්ඩල සංදේශය

**හදිසි අවශ්‍යතාව සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කඳුළු වායු උණ්ඩ (CS Shells) 10000 සහ කඳුළු වායු බෝම්බ (CS Grenade) 5000 බැගින් මිල දී ගැනීම සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම.**

**1.පසුබිම.**

1.1 වර්තමානයේ දිවයින තුළ පවතින ආර්ථික, දේශපාලනික සහ සමාජයීය අර්බුදකාරී වාතාවරණය යටතේ අත් කාල පරිච්ඡේදවලට සාපේක්ෂව දීප ව්‍යාප්තව අඛණ්ඩව උද්ඝෝෂණ, පෙළපාලි ආදී මහජන විරෝධතා පැවැත්වීම නිරීක්ෂණය වන අතර මෙම විරෝධතා ප්‍රචණ්ඩකාරී, තත්වයට පත් වීමේදී ඒවා මැඩ පවත්වා නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ වගකීම මූලිකවම ශ්‍රී ලංකා පොලිසිය වෙත පැවරී ඇත.

1.2 එවැනි ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් මැඩ පැවැත්වීම සහ විසුරුවා හැරීමට කරනු ලබන නියෝග පිළි නොගෙන කලහකාරී ලෙස ක්‍රියා කිරීමේ දී පිරිස් පාලනය සඳහා යොදා ගනු ලබන මූලිකතම ක්‍රමවේදය කඳුළු ගෑස් භාවිතය වන අතර එය හානි හා පීඩා අවම ක්‍රමවේදය ලෙස ගෝලීය වශයෙන් ද පිළිගෙන ඇත.

1.3 අවසන් වරට 2019 වසරේ දී කඳුළු වායු උණ්ඩ 15000ක් ද, 2020 වසරේ දී කඳුළු වායු බෝම්බ 5000ක් ද මිල දී ගෙන ඇත. නව පොලිස් ස්ථාන 111 ක් සඳහා ද නිකුත් කරන ලද කල් ඉකුත් වීමට ආසන්නව ඇති කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ හැර පොලිසිය සතු ආරක්ෂිත තොග අවසන් වීමට ආසන්නව පවතී. පොලිස් මධ්‍යම අවි ගබඩාවේ ආරක්ෂිත තොගය ලෙස කඳුළු වායු උණ්ඩ 1500ක් පමණක් ඇති අතර කඳුළු වායු බෝම්බ අවසන් වී ඇත.

1.4 ඉදිරි වසර කීපය තුළ ද දීප ව්‍යාප්තව උද්ඝෝෂණ හා පෙළපාලි ආදී විරෝධතා පැවතිය හැකි බව ක්ෂේත්‍ර විද්වතුන් පුරෝකථනය කර ඇති අතර මෙම පසුබිම තුළ නීති විරෝධී තත්ත්වයට පත්වන විරෝධතා විසුරුවා හැරීම සඳහා අවශ්‍යතාවට ප්‍රමාණවත් ලෙස කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ සපයා ගැනීමට නොහැකි වුවහොත් ඒ සඳහා විකල්ප ක්‍රමවේද අනුගමනය කිරීමට සිදුවන අතර ඒ තුළින් නෛතික ගැටළු මෙන්ම රජය අපහසුතාවයකට පත් වීම ද සිදු වනු ඇත.

1.5 ඒ අනුව ශ්‍රී ලංකා පොලිසියේ අවශ්‍යතාව සඳහා ඉතා කඩිනමින් කෙටි කාලයක් තුළ කඳුළු වායු උණ්ඩ 10000 ක් ද කඳුළු වායු බෝම්බ 5000ක් මිලදී ගැනීම අත්‍යවශ්‍ය වුවත් 2022 වර්ෂයට මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර නැති බැවින් අවශ්‍ය ප්‍රතිපාදන අතිරේකව වෙන් කර ගත යුතුව ද ඇත.

අතිරේක ලේකම් (පාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration)
දු. / தொ. / Tel : 011 2887576
ෆැක්ස් / பெ. / Fax : 011 2887756

අතිරේක ලේකම් (සංවර්ධන) / மேலதிக செயலாளர் (அபிவிருத்தி) / Additional Secretary ( Development)
දු. / தொ. / Tel : 011 2887417
ෆැක්ස් / பெ. / Fax : 011 2887883

ප්‍රධාන මූල්‍ය නිලධාරී / பிரதான நிதி அதிகாரி / Chief Financial Officer
දු. / தொ. / Tel : 011 2887396
ෆැක්ස් / பெ. / Fax : 011 2887636

**2. යෝජනා හා නිර්දේශ**

2.1 මේ සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය වඩාත් සුදුසු වුවද (NCB) එම තොරතුරු සමාජයේ විවිධ බාහිර පාර්ශව වෙත සංදේශනය වීමෙන් සමාජයේ වැරදි සහගත කතිකාවක් ගොඩනැගී රජය දෝෂ දර්ශනයට සහ අපහසුතාවකට පත් විය හැකි වේ. එබැවින් මෙම අයිතම කෙටි කාලයක් තුළ මිල දී ගැනීමේ අවශ්‍යතාව ද සලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.5 අනුව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිලදී ගැනීම වඩා උචිත හා අවස්ථානුකූල බව පෙනී යයි.

2.2 ශ්‍රී ලංකා පොලිසිය අවසන් වරට ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ ACE International, ආයතනය මගින් කඳුළු වායු උණ්ඩ 15000ක් ද, 2020 වසරේදී කඳුළු වායු බෝම්බ 5000ක් ද මිල දී ගෙන ඇත. එම ආයතනයේ මව් සමාගම වන දකුණු කොරියාව M/S. C-Rich Co. Ltd, වෙතින් කඳුළු වායු උණ්ඩයක් ඇමරිකානු ඩොලර් 9.77 කටද, කඳුළු වායු බෝම්බයක් ඇමරිකානු ඩොලර් 41 කටද (නැවට පටවන තෙක් මිල - FOB) සපයා ඇත. අදාළ ආයතනය විසින් එම මිල ගණන් යටතේම කඳුළු වායු උණ්ඩ සහ කඳුළු වායු බෝම්බ සැපයිය හැකි බව දන්වා ඇති අතර ඒ අනුව මෙම අයිතම එම ආයතනයෙන් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිල දී ගැනීම වඩාත් සුදුසු බව නිරීක්ෂණය වේ.

2.3 මෙය දැනට භාවිත කරන එම වර්ගයේම භාණ්ඩ අතිරේක වශයෙන් මිලදී ගැනීමක් ද වන අතර මෙම අයිතම මිලදී ගැනීම මීට පෙර මිලදී ගත් මුදලටම සිදු කරයි. තව ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 අනුව මෙය විශේෂ අවස්ථානුගත කරුණක් වන බැවින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් නිරීක්ෂණය වේ.

**3. අනුමැතිය**

ඉහත සමස්ත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර,

i. සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ACE International, AG/3/1, Sri Sangharaja Mawatha, Colombo 10 ආයතනය වෙතින්, එක් ඒකකයක් ඇමරිකානු ඩොලර් 9.77ක් (නැවට පටවන තෙක් ගාස්තුව - FOB) යටතේ කඳුළු වායු උණ්ඩ (CS Shells) 10000ක් ද, එක් ඒකකයක් ඇමරිකානු ඩොලර් 41ක් (නැවට පටවන තෙක් ගාස්තුව - FOB) යටතේ කඳුළු වායු බෝම්බ (CS Grenade) 5000ක් ද නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු, බදු සහ රේගු ගාස්තු ආදි අදාළ ගාස්තු ඇතුලත් කර මිල දී ගැනීමටත්,

ii. උක්ත අයිතම මිල දී ගැනීම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන 2022 වසර සඳහා භාණ්ඩාගාරය වෙතින් වෙන්කර ගැනීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

Tiran

ටිරාන් අලස් (පා.ම)
මහජන ආරක්ෂක අමාත්‍ය

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**
14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வதுமாடி, சுகுறுபாய, பத்தரமுல்ல, இலங்கை.
14th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. PS/03/PB/GEN/07/15/22
ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசி / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දු./ தொ./ Tel : 011 2868145; ෆැක්ස් பெ./ Fax : 011 2868135

දිනය / திகதி / Date: 22 .07.2022

**Cabinet Memorandum No. - 23/2022**

**Cabinet Memorandum**

**Allocation of provision to purchase 10000 CS shells and 5000 CS Grenades under the direct contract system on emergency requirement**.

**1. Background**

1.1 Depending on the economic, political and social crisis prevailing in the Island it is observed that public protests such as agitations and demonstrations are constantly occurred comparing with the past and the Sri Lanka Police is basically assigned with the responsible of safeguarding law & order controlling these protests becomes violent.

1.2 The preliminary methodology used to control riots who act against orders to disperse and to control such violent situations is use of CS gas and it is accepted globally as the method with less damage and distress as well.

1.3 Accordingly, 15,000 CS shells were purchased in the year 2019 while 5000 CS shells were purchased in the year 2020 for the last time. Safely stocks owned by the Police except CS Shells and CS Grenades which were issued and close to expire to 111 new police stations are almost out of stock. Only 1500 CS shells are available as safety stock of Police Central Armory and CS Grenade were run out.

1.4 In the context of where field experts have forecasted that these protests and demonstrations could be seen island wide during the next several years as well inability to obtain adequate CS shells and CS Grenades to disperse protests that are illegal could be created to apply optional methodologies and thereby legal issues as well as embarrassing the government would be experienced.

1.5 Even though purchase of 10000 CS Shells and 5000 CS Grenades for Sri Lanka Police with immediate effect within a short period is essential provision for the year 2022 is not allocated and additional provision has to be allocated.

## 2. Proposals & recommendations

2.1. Even though NSB method is the most suitable in this connection these information could be communicated to several outside parties & thereby government might face troubles & get in wrong with Taking in to consideration the requirement of purchasing these items during a short period it is more appropriate & occasional to purchase under direct contract method as per 3.5 of Procurement Guidelines.

2.2. Sri Lanka Police has purchased 15000 CS shells & 5000 CS Grenades in 2020 by ACE International under NCB for the last time. Also purchased CS shells per 9.77 dollars & CS Grenade 41 dollar (FOB) from M/s C-Rich Co Ltd. in South Korea the mother company of that institution. The relevant institution has informed that it is possible to supply CS shells & CS grenades under those prices & it is observed that it is more appropriate to purchase these items from those institution under direct contract.

2.3 This is an additional purchase of those goods and these items are purchased under the previous price. Moreover, this as a special occasion as per 3.5.1 of Procurement Guidelines and it is observed that obtaining cabinet approval is appropriate in this regard.

## 3. Approval

Taking in to consideration the foregoing facts I seek the approval of the Cabinet of Ministers,

i. To purchase 10000 CS Shells at 9.77 dollar each (FOB) and 5000 CS Grenades at 41 dollar each (FOB) from ACE International, AG/3/1, Sri Sangharaja Mw, Colombo 10 under direct contract method including shipments, insurance, taxes and custom charges.

ii. To allocate the additional provision required to purchase the above items from the Treasury for the year 2022.

Sgd./ Tiran Alles (M.P.)
Minister of Public Security